

**‘මා නිවත්ත අභික්කම’ – නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **58 වන කාණ්ඩය** | **බු.ව. 2559 නිකිණි මස පුරපසළොස්වක ද ක්‍රි.ව. 2015 අගෝස්තු මස 29 වන ද** | **04 වන කලබ** |

# අබිනික්මන

වෙළී ගිලී හද පුරා ම ඇක්මෙන
ඇලෙන බැඳෙන ගැටෙනා තැන් ඉක්මෙන
දයා කුලුණු ගුණ දළු ලන සක්මන
චිළි මහනෙකි සුව දෙන අබිනික්මන

අනුරා අනුරාවය ඉකි ගසනෙය
කඳුළින් පුස්කා ඇත කන්වයිනය
ලොව ම අඳුරු වී බොඳ වෙයි සිහිනය
අබිනික්මන දෙයි සොඳුරු ම සහනය

සිළී බිළී විසිරී යයි රළ පෙළ
නටුවෙන් ගිලිහෙයි මල් පල සහ කොළ
මහලු විය ද දෙයි සැරයටියට බල
අබිනික්මන් කරනට මෙය වෙයි කල!

**- අනඳ**



# ධර්මපාල වීර නාමය

**අතිපූජනීය පණ්ඩිත ගණේගම සරණංකර නාහිමිපාණන් වහන්සේ විසින් ලියන ලද්දකි.**

ශ්‍රේෂ්ඨ පුරුෂයෝ තිදෙනෙක් මා වශී කර ගෙන සිටිත්. අද ජීවතුන් අතර නැති ඒ තිදෙනාගෙන් එක්කෙනෙක් බුදුරජාණන් වහන්සේ ය. දෙවැන්නා දුටුගැමුණු රජතුමා ය. තුන්වැන්නා අනගාරික ධර්මපාල තුමා ය. මේ තිදෙනා තරම් මගේ හිත්ගත් වෙන කිසිවෙක් මෙතෙක් මේ ලොවේ ඉපිදී නැත. මේ තිදෙනාගෙන් මා දැක ඇත්තේ ධර්මපාලතුමා පමණකි. බුදුහාමුදුරුවන් ගැන සිතන්න, සිතන්න මේ තරම් ඥාණ සම්භාරයක් මිනිස් මොළයක කෙසේ අඩංගුව තිබුණාද යි මම පුදුමවෙමි. අනේ! උන්වහන්සේ දෑසින් දැකගන්නට ලැබුණා නම් කොයි තරම් වාසනාවක්දැයි සිතේ. දුටුගැමුණු රජතුමා ගැන සිතන්න සිතන්න, සිංහල ජාතියට, ජාත්‍යාලය හා ආගමාලය නැමැති ජීවය කවා, ජාතියත් ආගමත් බේරාගත් මහා වීරවරයා බව ඔප්පු වෙයි. ධර්මපාලතුමා ගැන සිතන්න සිතන්න එතුමා තුළ පැවැති අභිමානවත් පෞරුෂයත් නිර්භීතභාවයත් පිරිසිදු චරිතයත් එතුමා බෝධිසත්ත්වයකු නිර්මාණය කොට පෙන්වයි.

මීට අවුරුදු 35 කට පෙර මා දඹදිව සිටිද්දී ලියූ ලිපියක "ලංකාවේ පළාත් නවයේ ධර්මපාල ප්‍රතිමා නවයක් තිබිය යුතුය" යි ලීවෙමි. උතුරු - නැගෙනහිර දෙපළාත හැර අනෙක් පළාත් හතේම ධර්මපාල ප්‍රතිමා දක්නට ලැබීම මගේ ඒ පැතුම සාර්ථක වීමකි. ජාතිය වැටී තිබුණු පිරිහීම් ප්‍රපාතයෙන් ගොඩ ගත්තේ ධර්මපාලතුමා ය. ලෝකයේ කිසිම නායකයෙක් එතුමා තරම් තම ජාතියට බැණ වැදී නැත. 'වල් අලියා' 'ගොන් තඩියා' යන වචනවලින් මූණ ඉදිරිපිට එතුමා මිනිසුන්ට බැන්නේ ය. පුදුම නම් ඒ බැණීම් ගැන කිසිවෙකු තරහ නොවීමයි. එතුමා බණින්නේ ජාතිය ගැන ඇති වේදනාවෙන් බව හැම දෙනාම දැන සිටියහ.

අපේ රටත්, ජාතියත්, ආගමත්, සංස්කෘතියත් හදන්නට ධර්මපාලතුමා තරම් මහන්සි වූ, කැප වූ, පරිත්‍යාග කළ වෙන කිසිවෙක් නැත. එතුමා පහළවූයේ සිංහල ජාතියේ පුරාකෘත පුණ්‍ය බලයකිනි. එතුමා නූපන්නේ නම් දඹදිව බුද්ධගයාවේ ශ්‍රී මහාබෝධිය තවමත් හින්දුන් අතේ ය.

එතුමාගේ චරිත කතාව හැම සිංහලයකු විසින් ම කියවිය යුතු ය. එය එක් කෙනෙකු දෙන්නෙකු විසින් නොව නොයෙක් ලේඛකයන් විසින් නොයෙක් දෘෂ්ටිකෝණ අනුව ලියයුතු ය. එතුමා ජනනායකයෙකි, අනගාරිකයෙකි, භික්ෂුවරයෙකි, කථිකයෙකි, දේශකයෙකි, ධර්මදූතයෙකි, ජාත්‍යාලය ඇති නායකයෙකි, භක්තිමත් බෞද්ධයෙකි, මහා දානපතියෙකි, ජාත්‍යන්තර කීර්තිමත් සිංහලයෙකි, සංස්කෘතික විප්ලවයක් ඇතිකළ කෙනෙකි, ත්‍රිපිටකධාරියෙකි, උපසම්පද භික්ෂුවරයෙකි.

මා ප්‍රියකළේ ඉතා ශාන්තදාන්ත උසම්පද භික්ෂුවක් ව සිටි සිරි දේවමිත්ත ධර්මපාල රූපයට වඩා එඩිතර නිර්භීත ප්‍රෞඪ අනගාරික ධර්මපාල රූපයටයි. අහෝ! ධර්මපාලතුමනි, මේ නැවතත් ඔබතුමා සිටියයුතු කාලයයි.

**කේ. බී සුගතදස සූරීන් ගේ අනගාරික ධර්මපාල අපදානය කෘතියෙනි. (1986)**

සිංහල නම් කැතමය පර නම් ගරුවෙයි නිතිනේ
සිංහල ඇඳුමුත් පැළඳුම් මට නම් එම ලෙසිනේ
සිංහල සිරිතුත් හොඳ නැත පර සිරිතුයි හොබනේ
සිංහල කිසිවක් හොඳ බව මගෙ දෑසට නොපෙනේ

සිංහල බාසය ගරු නැත පර බාසා දනි මී
සිංහල කෑමට බීමට එලෙසින් රිසි නොවෙ මී
සිංහල වී ඉපදීමත් නින්දවකි සිත මී
සිංහල මගෙ ඇස් වැසිලා මුළුවී දැන් සිටි මී

"සිංහල සහෝදරයිනි, සිංහල ජාතිය නැති කිරීමට නා නා ජාතිකයන් අප ලංකාවට පැමිණ සිටින මේ කාලේ නිද නොගෙන අප්‍රමාදීව දුෂ්ට සිත් දුරු කොට සමඟිකමින් ක්‍රියා කරව්!"

**-අනගාරික ධර්මපාලතුමා**



# තථාගතයන් වහන්සේ ගේ ජීවිතක්ෂය කිරීම පරෝපක්‍රමයකින් බැරි බව

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා විසිනි.

**චුල්ලවග්ග පාලියේ මෙසේ බුදුරජාණන් වහන්සේ වදාළ සේක:**

"අට්ඨානමේතං භික්ඛවේ අනවකාසෝ යෝ පරූපක්කමේන තථාගතො පරිනිබ්බායති ති." යම් පරෝපක්‍රමයකින් තථාගතයන් ජීවිතයෙන් තොර කිරීමට නොහැකිවීමෙන් ලෝකයෙහි අනික් ශාස්තෘන්ට වඩා අප බුදුරජාණන් වහන්සේ අතිශයින් ශ්‍රේෂ්ඨ යි. කොන්පියුසියස් පණ්ඩිතයා විසින් දුන් අවවාද රටවාසීන් විසින් නොපිළිගත් බැවින් සෝකයෙන් රට හැර යන්ට ගියේ යි. තථාගතයන් වහන්සේ පිරිනිවන් මඤ්චකයෙහි දීත් භික්ෂූන්ට අවවාද කළ සේක. "මහණෙනි, අප්‍රමාදව නිවන්මග සොයව්." ("අප්පමාදේන සම්පාදේථ") මෙසේ සතළිස්පස් වර්ෂයක් ධර්මානුග්‍රහ කර වදාළා වූ තථාගතයන් වහන්සේ කොන්පියුසියස් මෙන් තමන් අකමැති දේ අනුන්ට නොකරව්"යන අවවාදය නුදුන්නේ ද? සර්වඥයන් වහන්සේ විසින් වදාළා වූ ධර්ම පරියාය බොහෝ යි. එසේ නුමුත් අපේ ස්ථවිර මධ්‍යම නවක භික්ෂූන් වහන්සේලා

මේ ධර්මාමෘත භෛෂජ්‍යයන් බෙදා දෙන්නේ නැත. තථාගත ධර්මය ලෝකයාට ප්‍රකාශ කරන්ට අභෝ වීර්ය ගන්නවා නම් බුද්ධාගම ලොව විජෘම්භමාන වන්නේ ය.

බොහෝ රටවල මා සර්වඥ ධර්මය උතුම් බව ප්‍රකාශ කරන්නේ අනෙක් ශාස්තෘන්ගේ මත විනාශකරමින් තථාගත වචනයට සමාන කොට බලා තථාගත ධර්මය ශ්‍රේෂ්ඨ බව තේරුම් ගත් නිසයි. බුද්ධ ධර්මය නොදත් ලාභ අහංකාර මමංකාරයෙන් මත්වී බොහෝ සිංහලයන් ක්‍රිස්තු සමය පිළිගෙන තිබේ. නිර්මල සුගන්ධ ජලය අතහැර මඩ ගොහොරු සොයා යන සූකරයන් මෙන් "කාලකණ්ණි පව්කාර" කොටසක් දස අකුසල කර්ම නොකරන්නට කියන ආගම අත්හැර දස අකසල කර්ම කරන්නට උගන්වන මිථ්‍යාව ආශ්‍රය කරන්නේ ය. අපේ භික්ෂූහු කුසීත කම අත්හැර අප්‍රමාද පදය මුල් කරගෙන කාම භෝගීන් මෙන් නොසිට ආවාස, කුල, ලාභ, ධම්ම, මච්ඡරියයන්ගෙන් තොරව ආරද්ධ විරියෙන් ශ්‍රද්ධා සිතින් ධර්ම දේශනා කිරීමට උත්සාහ කරත් නම් දෙවියන් සහිත ලෝකයාට සැප ලැබේ.

තමන් අකමැති දේ අනුන්ට නොකරව් යන අවවාදය තථාගත ධර්මයෙහි සොයා යන කල සම්භවූයේ ය. සංයුත්ත නිකායෙහි සෝතාපත්ති සංයුත්තයේ වේළුද්වාර වර්ගය බැලිය යුතු යි.

**"අත්තූපනායිකං වො ගහපතයො ධම්මපරියායං දේසිස්සාමි, ඒවං භෝති බෝ තේ වේළුද්වාරෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා භගවතො පච්චස්සෝසුං. භගවා ඒතදවෝච. කතමො ච ගහපතයො අත්තූපනායිකො**

**ධම්මපරියායො? ඉධ ගහපතයො අරිය සාවකෝ ඉති පටිසංචික්ඛති: අහං බෝස්මී ජීවිතු කාමෝ අමරිතුකාමෝ සුඛකාමෝ දුක්ඛ පටික්කූලෝ, යෝ බෝ මං ජීවිතුකාමං අමරිතුකාමං දුක්ඛපටික්කූලං ජීවිතා වෝරොපෙය්‍යය, න මෙ තං අස්ස පියං මනාපං, අහං චේව බෝ පන පරං ජීවිතුකාමං අමරිතුකාමං සුඛකාමං දුක්ඛපටික්කූලං ජීවිතා වෝරොපෙය්‍යයං පරස්සපි තං අස්ස අප්පියං අමනාපං යෝ බෝ ම්‍යායං ධම්මො අප්පියො අමනාපො පරස්සපෙසො ධම්මො අප්පියො අමනාපො කථාහං පරං තේන සංයෝජෙය්‍යයන්ති සෝ ඉති පටිසංඛාය අත්තනා ච පාණාතිපාතා පටිවිරතෝ හෝති. පරං ච පාණාතිපාතා වෙරමණියා සමාදපේති, පාණාතිපාතා වේරමණියා ච වණ්ණං භාසති, ඒවමස්සායං කායසමාචාරෝ තිකෝටි පරිසුද්ධෝ හෝති.”**

මෙසේ අදින්නාදනය, පරදර කර්මය, මුසාවාදය, පිසුනාවාචය, සම්පප්‍රලාපය යන ධර්මයන්ගෙන් විරහිතව ත්‍රිවිධරත්නයෙහි සරණ යෙමින් අඛණ්ඩ සීලයෙන් යුක්තව යමෙන් සිටී නම් හෙතෙම සෝතාපත්ති මාර්ගයෙහි ගමන් කරන්නේ ය යි අප බුදුරජාණන් වහන්සේ වදළේ යි.

උතුම් වූ ආර්ය ධර්මය අතහැර ඇතැම් සිංහලයන් පව් කරන්නට උගන්වන මිථ්‍යා මතය පිළිගෙන තිබේ. ඊට හේතුව අසත්පුරුෂ ආශ්‍රයයි. බුද්ධ ධර්මය බාල කාලයේ දී කනට වැටෙන්නේ නැත. දිනෙන් දින මිථ්‍යා ධර්මයන් කනට වැටීමෙන් මිථ්‍යාදෘෂ්ටි පාපයන් කිරීමෙන් කාම සැප සේවනයට ආශාවෙන් උදරාර්ථය නිසා බුද්ධ ධර්මය අත් හැර ඔව්හු මිථ්‍යාගම පිළිගත්තෝය.

මිථ්‍යා දෘෂ්ටිය ගත් අය නීරෝගිව ජරාවට නොපැමිණ මරණයට නොපැමිණ ඒකාන්ත සැපයෙන් සිටිනවාද? කන්නේ බතුයි. කථාකරන්නේ සිංහල භාෂාවයි. ඒ බෞද්ධ ජාතීන් අත්හැර මිථ්‍යාවාදීන් ආශ්‍රය කරණු ලැබේ. විසිහයලක්ෂයක් ඥාතීන් අත්හැර දමා පරදේශී ස්වල්ප දෙනෙකු සතුටු කරන්නට යන සිංහල ක්‍රිස්තියානිකාර සහෝදරයිනි! ඒකීභාවයෙන් සමඟිකමින් අත්තූපනායික ධර්මපරියායේ හැටියට පිළිපදිමින් වසව්.

සුද්ද හොඳ ටික කා අපට දෙන්නේ ඇට ටික පමණයි. අපි එකතුව ක්‍රියා කරමු. අප මහා රජතුමා ඉන්දියා රටවැසි බ්‍රාහ්මණ භක්තිකයන්ටද ඉල්ලන ලද දේ දුන්නේ ය. උන් ක්‍රිස්තු භක්තිය පිළිගත්තේ නැත. ලංකාවේ මරක්කල හම්බකාර දෙමළ පිරිස් දෙස බැලුව මැනවි. මත් බීම විකිණීම අත්හැර දමා මත්පැන් පානය අත්හැර දමා ශ්‍රේෂ්ඨජාතියක් වීමට උත්සාහ වඩනු. අපේ භික්ෂූන්වහන්සේලා ශික්ෂාකාමීව සිටිත් නම් අපට දෙවියන් සහිත ලෝකයාගෙන් ආධාර ලැබේ.

ලංකාවාසී බෞද්ධ පිරිස මස්කෑමට ගිජුකම පෙන්නීම නිසා පරජාතිකයන් අප රටට පැමිණ අහිංසක සතුන් මරා විකුණති. සර්වඥයන් වහන්සේ සියලුදෙනාටම කරුණාව පෙන්වා වදාළේයි. දීඝ නිකායේ පාටික වග්ගයේ ලක්ඛණ සූත්‍රයේ බෝධිසත්ත්වයන් වහන්සේ මනුෂ්‍යව උපන්කල පිළිපදින ධර්ම මේ මේවා යයි දක්වා තිබේ. ඒ ධර්ම භාවිත කිරීමට මෙකල විශේෂයෙන්ම සිතට ගත යුතුයි. බෝධි සත්ත්ව ධර්මයක් නම් "**සත්තානං අවිහේසික ජාතිකෝ අහෝසි පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩේන වා**

**සත්ථේන වා"** යනු යි. කොයිලෙසකින් වත් සත්ත්ව හිංසා නොකොට දයා සිත් දක්වමින් ප්‍රාණඝාතය වළක්වන්ට එක එක බෞද්ධයා විසින් උත්සාහ කටයුතුයි.

බාලකාලයේ දී මාංශ අනුභව කිරීමට කැමැත්ත මට තදින් තිබුණේ ය. 19 පමණ වයසේදී යම්කිසි විධියකින් ඉංග්‍රීසි පොතක් කියවන්නට මට ලැබුණේය. එයින් සත්ත්ව හිංසාව නොකරන්නටත් මාංස කෑම අත්හැරීමටත් අධිෂ්ඨාන කළෙමි. උම්බලකඩ දමා උයන එළවලුද නොකා අත් හැරියෙමි. මස් මාංස උම්බලකඩ අත්හැර දැමීම සෑම අතින්ම බෞද්ධයන්ට වටින්නේය. සත්ව කරුණාව පෙන්වීම, ජීවිත දානය දීම, අභයදානය දීම, මෛත්‍රී කිරීම, ප්‍රාණඝාතයෙන් වැළැකීම, අනුන් ලවා නොකරවීම, අනුබල නොදීම, **"උද්දිස්සකතමංස"** නොකෑම, දුටුවොත් ඇසුවොත් සැක කළොත් ත්‍රිකෝටි පරිශුද්ධියක් නො වීම, මංස වණිජ්ජාවෙන් තමන් වැළකීම, අනුන් වැළැක්වීම, මේ ආදීය ගැන කල්පනා කරන කල කිසිසේත් උන්මත්තක නුවූ කෙනෙකුට මස් කෑම කළ නොහැකියි. බෞද්ධ රටක් වූ ලංකාවේ හොර හරක් මැරීම බහුලව කරනු ලැබේ. ප්‍රාණඝාතය සුරාමේරය යන මේ දෙකින් වෙන්වීම නොකරන බෞද්ධයා පාපතරයෙකි. කොළඹ, ගාල්ල, මාතර, මහනුවර, ආදී නගරවල සිටින බෞද්ධ ජනයා සම්මත කර ගෙන අණබෙර ගසා අද පටන් බෞද්ධ වූ කෙනෙක් උදෙසා මරණලද මස් කෑම අරක්කු බීම නො කටයුතු යයි ප්‍රකාශයක් කිරීමට ආරම්භ කටයුතු යි.

මස්කෑම මධ්‍යම ප්‍රතිපදා ධර්මයට විරෝධයයි කරුණු පෙන්නා දුන් කල පවින් වැළකීම උන්මත්තක නුවූ අයගේ

ධර්මයකි. මීට යථාභූත ඤාණයයි ව්‍යවහාර කෙරෙති. "**ඉදං සති ඉදං හෝති, ඉදං අසති ඉදං න හෝති**" යනු පටිච්චසමුප්පාද ධර්මයයි. මේ සම්බන්ධ පාළි පාඨය මෙහි දක්වනු ලැබේ. "**පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතෝ හෝති. නිහිත දණ්ඩෝ නිහිත සත්ථෝ ලජ්ජී දයාපන්නෝ සබ්බපාණ භූතහිතානුකම්පි විහරති.**"

නොපෙරන ලද ජලය පානය කිරීම වරද සහිතයි. තණකොළයක් පවා කැඩීම එපා කොට භික්ෂූන්ට මහාවග්ග පාලියේ චම්මක්ඛන්ධකයේ දක්වා තිබේ "**ඒකීන්ද්‍රියං සමණා සක්‍යපුත්තියා ජීවං විහෙඨෙන්තීති**" බොහෝ මනුෂ්‍යයන් විසින් නිග්‍රහ කරන යමක් කිරීම බුද්ධාගමට විරුද්ධයි. එක්තරා පාප භික්ෂු කෙනෙකු පාප උපාසකයෙකු ලවා ප්‍රිය, දර්ශනීය වස්සෙකු මරවා උගේ හම පිළිගෙන තිබේ. මෙ තැනදී අප බුදුරජාණන් වහන්සේ මේ පාප භික්ෂුවට නිග්‍රහ කොට මේසේ වදළේ ය. "**නනු මයා මෝඝ පුරිස අනේක පරියායේන පාණාතිපාතෝ ගරහිතෝ පාණාතිපාතා වේරමණී පසත්ථා නේතං මෝඝ පුරිස අප්පසන්නානං වා පසාදය......**" මහා වග්ගයේ භෙසජ්ජ කාණ්ඩයේ සුප්පියා උපාසිකාව දුන් මාංශය කෑ එක්තරා භික්ෂුවක් නිසා "**න ච භික්ඛවේ අප්පටිවෙක්ඛිත්වා මංසං පරිභුංජිතබ්බං**" යනු වදරා තිබේ. සුප්පියා උපාසිකාව මේ භික්ෂුවට මස් ව්‍යාංජනයක් සාදා දෙන අදහසින් ගෙදරට පැමිණ පවත්ත මාංස දනගෙන මිලදී ගැනීමට පුරුෂයෙකු බරණැස් නුවරට යවා තිබේ. පවත්ත මාංස සොයා නැති බැවින් හිස් අතින් හෙතෙම ගෙදර ආවේය.

සිංහ සේනාපතියා අප බුදුන් කරා ගොස් බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට දනයක් දී තිබේ. මේ දනයට "**පවත්ත මංස**" ගැනීමට පුරුෂයෙකු යවා තිබේ. මේ බව ඇසූ නිගණ්ඨයෝ විසාලා මහනුවර වීථියක් පාසා කඳුළු වගුරුවමින් අද සිංහ සේනාපතියා ශ්‍රමණ ගෞතමයන්ට දන්දෙන පිණිස ස්ථූල වූ ගොනෙක් මරණලද්දේ යයි කියා ඇවිද්දේය. මෙය ඇසූ අය සිංහසේනාපතියා කරා පැමිණ ඒ බව සැල කළහ. එවිට සේනාපතියා මෙසේ උත්තර දුන්නේයි. "**නච මයං ජීවිත හේතුපි සංචිච්ච පාණං ජීවිතා චොරොපෙයයාමාති.**" බුදුහු මේ ප්‍රස්තාවේදී "**න භික්ඛවේ ජානං උද්දිස්සකතං මංසං පරිභුංජිතබ්බං**" යී වදළේ ය. දේවදත්ත ස්ථවිරයෝ බුදුන් කරා පැමිණ, "**යාවජීවං මච්ඡමංසං න ඛාදෙය්‍යුං.**" කිසි කලක මස් මාංශයක් නොවළඳන හැටියට ප්‍රඥප්තියක් පැනවීමට ඉල්ලූ කල බුදුරජාණන් වහන්සේ ඊට එකඟ නො වීය. ඕනෑ පුද්ගලයෙකුට එසේ කරන්නට ඉඩදී ත්‍රිකෝටි පාරිශුද්ධියෙන් "**අදිට්ඨං අසුතං අපරිසංකිං**" යන්නෙන් ලැබුනොත් ඒ මස් වළඳන්නට අවසර දුන්නේ ය. බ්‍රාහ්මණ ධම්මික සූත්‍රයේ පශුඝාතනය නිසා සියලු රෝග ලොව ඇති වූ බව බුදුහු වදළෝය. සම්මාසංකප්පො, සම්මාකම්මන්තො, සම්මාආජීවො යන අංග තුනක් භාවිතා කරන ශ්‍රාවකයෙකු උදෙසා මරනලද මස් දවසක් පාසා මිලදී ගැනීමෙන් සත්ත්ව ඝාතනයටද මාංශ විකිණීමටද අනුබල දෙන්නේ ය. මෛත්‍රී භාවනාව නිතරම කරන කෙනෙක් සත්තව ඝාතනය කරන්ට ක්‍රියා කරන්නේ නැත. සද්ධාතිස්ස රජතුමාට වටුමස් ටිකක් ලබා ගැනීමට තුබුණු අමාරුකම් පෙන්වන කථාවද මෙතනදී මෙනෙහි

කටයුතුයි. ආර්‍ය ධර්මය ආශ්‍රය කරන ආර්ය ජාතියට අයිති සිංහල බෞද්ධ සහෝදරයිනි! බුද්ධ වචනය ආදරයෙන් භාවිත කොට භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය මට පිහිට වේ වා යි අධිෂ්ඨාන කොට විකිණීමට මරනලද මාංශ මිලදී නොගැනීමට මත්පැන් නො බීමට දෘඪ සිතින් වීර්‍ය කරනු මැනවි.

දඹදිව ක්‍රිස්තියානිකාර සමූහයා ගොමාංස භක්ෂණය කරන්නේ නැත. **"සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා"** යන පාඨය සිහි කට යුතු යි. මේ කාලේ කාමභෝගී භික්ෂූන්ගේ සංඛ්‍යාව වැඩි වී තිබේ. යථාභූත ඥානයට අනුව යෝනිසෝමනසිකාරයෙන් කල්පනා කළාම මේ මේ හේතු නිසා අපේ භික්ෂූහු කාමභෝගීව සිටිත් යයි පෙනේ. ගෘහපති පිරිස විසින් යට දැක්වූ අත්තුපනායික ධර්මපරියාය භාවිත කටයුතුයි. සීලසම්පන්න ගිහි සමූහයා වැඩිවූ කල භික්ෂූන් ප්‍රව්‍රජ්‍යා ධර්මයට අනුව ක්‍රියාකරනවාට සැක නැත. ලබන සතියේ බෝධිසත්ත ධර්මපරියාය මෙහි ප්‍රසිද්ධ කරනු ලැබේ. අධර්මවාදීන්ට බලය ඇති මේ කාලයේ ලංකාවෙන් ඈත්ව මධ්‍ය මණ්ඩලයේ බරණැස සිටීම විවේක සැපයට සාර්ථකයි. බෞද්ධ පිරිස දහක්වත් එකී භාවයෙන් ක්‍රියා කරන්නට සම්මතකරගෙන බෝධිසත්ත්ව ධර්මයන් විපුල භාවයට පමුණුවන්නට වීර්ය කරනවා නම් ලැබිය හැකි විවේක සැප සෙවීම මට අත්හැර දැමිය හැකිය.



# බස - රැස - දෙස - සසුන සුරකින ධර්මපාල පරපුරක් හදමු

"ගුරු සීයා" විසිනි

19 වන සියවසේ අග භාගයේ ශ්‍රී ලංකාවේ විසූ වීර පුරුෂයන් අතර ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාට හිමි වනුයේ අද්විතීය ස්ථානයකි. ගිහි පක්ෂයෙහි ධර්මපාලතුමා සිදු කළ ජාතික හා ආගමික සේවාවට සරි ලන වෙනත් වීර පුරුෂයකු ගේ සේවාවක් ගැන අපට කල්පනා කළ නොහැකි ය. සිංහල බෞද්ධයා වෙනුවෙනුත් සම්බුද්ධ ශාසනය වෙනුවෙනුත් පොදුවේ ශ්‍රී ලංකාවාසීන් වෙනුවෙනුත් එතුමන් කළ සේවාව විශිෂ්ටතම වේ.

මාතර ඒ. පී. ධර්මගුණවර්ධන මහතා ගේ දියණියන් වූ මල්ලිකා ධර්මගුණවර්ධන (පසුව හේවාවිතාරණ) මහාත්මනිය හා මාතර දෙන් කරෝලිස් හේවාවිතාරණ මහතා මවුපියන් කොට ධර්මපාලතුමා මෙ ලොව එළිය දුටුවේ 1864 සැප්තැම්බර් 17 වන ද ය. එතුමා ලබාගත් 'ඩේවිඩ්' යන නම 'ධර්මපාල' යනුවෙන් වෙනස් කර ගත්තේ නව යොවුන් වියේ පටන් දළුලමින් පැවැති ජාතිකාභිමානයත් දේශානුරාගයත් නිසා ය.

සියවස් තුනක් පුරා මෙරට පැවැති විදේශාධිපත්‍යය නිසාත් මිෂනාරි ආගම් ව්‍යාප්තිය නිසාත් ස්වදේශික වූ සිංහල

ජනතාවට විවිධ අභියෝගවලට මුහුණ දෙන්ඩ සිදු විය. සිංහල ප්‍රභූ පන්තිය බෙහෙවින් ම විදේශ පාලනය රිසි කළ දීන ගැති මානසිකත්වයක් ඇත්තෝ වූහ. දේශීය ආර්ථිකය මෙන් ම, බුද්ධාගමේ ආභාසයෙන් දියුණු වූ අපේ සිතුම් පැතුම් හා ජීවන රටාවද, සදාචාරය, සිරිත විරිත, භාෂාව හා ජන ජීවිතයද කෙමෙන් කෙමෙන් විජාතික විසංස්කෘතික ග්‍රහණයේ සැඩ පහරට හසු වෙමින් පැවැතිණි. සිංහල ජාතිය අක් මුල් නැති ජන වර්ගයක් ලෙස කෙමෙන් පිරිහෙමින් සිටියේ ය.

දියුණුවේ වෙස් වළාගත් මෙ ම ජාතික විපත ගැඹුරින් දූරදර්ශී ව වටහාගත් මිගෙට්ටුවත්තේ ගුණානන්ද මාහිමියන් වහන්සේ, හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, දෙඩම්දූවේ පියරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ වැනි සංඝ පිතෘන් වහන්සේලා ඒ වන විට මිෂනාරි බලවේගය විසින් ප්‍රචාරයකරනු ලබමින් සිටි බුද්ධාගමට විරුද්ධ අසත්‍ය මතවාදවලට දැඩි ලෙස ප්‍රතිප්‍රහාර ලබා දෙමින්, බෞද්ධ පුනරුදයක් ඇති කරමින් සිටියහ. පාණදුරාවාදය එහි උච්චතම අවස්ථාව විය. අමෙරිකානු ජාතික හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා ලංකාවට සැපත් වන්නේ මේ පාණදුරා වාදයේ ප්‍රතිඵලයක් වශයෙනි. ලංකාවේ බෞද්ධ පුනරුදය සඳහා ඕල්කොට්තුමා බලවත් ශක්තිය ලබා දුන් නමුදු එතුමා ගේ පරමවිඥානාර්ථවාදී ක්‍රියාදාමයේ යම් යම් අඩුපාඩුකම් නිසා මිගෙට්ටුවත්තේ මාහිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමි වැනි බෞද්ධ පුනරුදයේ පුරෝගාමී බලවේග එතුමාගෙන් ඈත් වන්නට විය. ඕල්කොට්තුමා සමඟ එතුමා ගේ කථා සිංහලයට පරිවර්තනය කරමින්, එ ම බලවේගය තුළ සිටි, ඒ වන විට 19 වන වියේ සිටි ධර්මපාල තරුණයාට ද මේ කරුණ වැඩි කල් නො යා වැටහිණ.

ජාතියේ පිනින් පහළ වූ ධර්මපාල තරුණයා කුඩා කල සිට මෑණියන් ගෙන් ලද ආගමික ආභාසය නිසාත් මිගෙට්ටුවත්තේ

මාහිමියන් හා හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමියන් වහන්සේ ගේ ළඟ ඇසුර නිසාත්, සියලු ගිහි සම්පත් අත් හැර, අනගාරික ව සම්බුද්ධ ශාසනයේ ආරක්ෂාව හා සිංහල ජාතියේ සමුන්නතිය පිණිස සිය මුළු දිවිය ම කැප කරන්නට අදිටන් කැරගත්තේ ය.

විජාතික බලවේග හමුවේ සිංහල බෞද්ධයා අසරණ වන ආකාරයත් ඇතැම් සිංහල ප්‍රභූන් ඊට රැකුල් දෙන ආකාරයත් එතුමා දුටුවේ ය. නිවට ව, නියාලු ව, අලස ව, ගැති ව, දීන ව, සිංහලයා විජාතික පාලකයන් හමුවේ සැලෙන, වෙව්ලන, වැඳ වැටෙන අයුරු දුටු එතුමා ජාතියට පිට කොන්දක් ලබා දීමේ අවශ්‍යතාව මැනැවින් දක්කේ ය. ඉංග්‍රීසි පාලකයන් ගේ අධ්‍යාපනයෙන් ජාතියට, භාෂාවට හා සභ්‍යත්වයට වන හානිය කල්පනා කළ ධර්මපාලතුමා බෞද්ධ අධ්‍යාපනය ශක්තිමත් කොට, බෞද්ධයාට ගැළැපෙන හැදියාව පසුබිම් කරගත් අධ්‍යාපනයක් ළමා පරපුරට දෙන්නට උත්සාහවත් විය. එහි ලා ශිෂ්‍ය ප්‍රජාව තුළ නවෝත්පාදනය ආර්ථික ආකල්පයන් කෙරෙහි අවධානය යොමු කරවූ අයුරු පෙනේ. ජාතියට රටකට ආර්ථික අංශයෙන් නැඟී සිටීමේ වැදගත් කම ධර්මපාල ලිපි ලේඛනවලින් පැහැදිලි වේ.

ලංකාවේ ජාතිකානුරාගී චින්තනය, සමාජයේ සදාචාරාත්මක යහ පැවැත්ම හා ජන ජීවිත තුළින් සද්ධර්මය බල ගැන්වීම කෙරෙහි දැඩි කැක්කුමකින් ක්‍රියා කළ ධර්මපාලතුමා දඹදිව බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංවර්ධනය කොට සංරක්ෂණය කිරීම අරබයා කළ මහඟු මෙහෙවර සුවිශේෂ ය. ලෝකවාසී සියලු බෞද්ධයෝ ම ඒ වෙනුවෙන් ධර්මපාලතුමාට ණය ගැතිය. බුද්ධගයාව බේරා ගැනීම වෙනුවෙන් කළ සටන සුව යහනාවක සිට කළ දෙයක් නො වේ. කුසට අහරක් නැති ව, නිදි නැති ව, සිරබත් කමින්, නින්ද - අපහාස -වේදනාවලට භාජනය

වෙමින්, කිසි ලෙසකිනුදු ඒවාට කම්පා නො වී කළ උදාර සටන ධර්මපාලතුමා ගේ ධර්ම වීරත්වය පිළිබිඹු කරයි.

ඒ ශ්‍රේෂ්ඨ වීර පුරුෂයා ගේ 150 වන ජන්ම දිනය සමරන මෙ කල අප විසින් කළ යුතු වැදගත් ම ජාතික මෙහෙවර වනුයේ එතුමන් හෙළි කළ අදීන ජාතික චින්තනයෙන් අපේ රටට ජාතියට ආගමට භාෂාවට හිත ඇති නව පරපුරක් බිහි කැරගැනීම මිස අන් දෙයක් නොවේ. එතුමා ගේ පිළිම කොතරම් හැදුවත්, කොතරම් සමරු මුද්දර පළ කළත්, කොතරම් සමරු උත්සව පැවැත්වුවත් යථෝක්ත කාර්ය භාරය වග කිය යුත්තන් අතින් සිදු නො වේ නම්, ධර්මපාල තුමා ගේ උදාර අරමුණු හා අපේක්ෂා අප විසින් ම විනාශයට පත් කිරීමක් වේ.

ගෞරවනීය ගණේගම සරණංකර නාහිමිපාණන් සිය "ජාතියේ පියා හෙවත් අනගාරික ධර්මපාල" කෘතියෙහි සඳහන් කළ ලෙස, "මේ රටට වෙලා තියෙන ලොකු ම විපත ධර්මපාලතුමා අමතක කිරීම යි, එතුමන් ගේ දේශනා අමතක කිරීම යි, එතුමා කළ සේවය අමතක කිරීමයි, එතුමා පෙන්වූ මඟ නොයෑම යි, එතුමා ගේ අදහස් නොපිළිපැදීම යි. අවු. 47ක් මුළුල්ලේ රට ජාතිය හා ආගම දියුණු කරනු සඳහා එතුමා ගත් දැඩි උත්සාහය ගැන නොතැකීම ය."

එහෙයින්, භික්ෂූන් වහන්සේලා, මවුපියන්, ගුරුවරුන්, රාජ්‍ය පාලකයන් හා අනෙක් සමාජ නායකයන් රටේත් ජාතියේත් අනාගතය වෙනුවෙන් දැන් දැන් ම කළ යුතු කාර්යය නම් හැදෙන නව පරපුරට ධර්මපාලතුමා අඳුන්වා දීම ය. රට - ජාතිය - භාෂාව - ආගම රැකීමේ දම්පල්තුමන් ගේ උදාර අදිටන නව පරපුරේ හදවත් තුළ සනිටුහන් කරවා පණ ගැන්වීම ය. බල ගැන්වීම ය.



# යළිඳු වඩිනු මැන දම්පල් හිමි සඳ

"පොඩි හාමුදුරුවෝ "

| | |
|---|---|
| ඉරා තිමිර මිස අඳුර | දුරැරලා |
| බල බිඳි ජාතිය බසින් | පණපොවා |
| දැයේ සවිය එක් සේසත් | කරලා |
| සිරි දම්පල් හිමි සඳුන් | වඩිනවා |
| | |
| කියනා හැමදෙය කෙරුමෙන් | පෙන්වා |
| නිවටුන් හට හෙළ අබිමන් | වඩවා |
| කළු සුද්දන් ගේ ඇස් කන් | අරවා |
| සිරි දම්පල් හිමි සඳුන් | වඩිනවා |
| | |
| සංකර සිරිතෙන් අවපස යන | බැස |
| පවින් වැනසෙනා ජාතිය දැක | දැක |
| දිව රෑ දෙකෙහි ම නො නිඳා | අවදි ව |
| කළ මහ මෙහෙවර අනුපම වේ | යස |
| | |
| බුදු හිමි තෙවරක් වැඩිය | සිංහලේ |
| හෙළ මහ නිරිඳුන් සුරැකි | සිංහලේ |
| කප් සුවහස් කල් වොරැඳි | සිංහලේ |
| රැක දුන් විරුවා ඔබයි | සිංහලේ |
| | |
| දම් රජු දිනු මහ බෝ මැඩ | සෙවණේ |
| රහතුන් වැඩි මඟ සිල් දම් | සෙවුනේ |
| සසුනඹරේ මිණි පහනක් | ලෙසිනේ |
| දිලුණා දිලි දිලි සමිඳු හැම | දිනේ |
| | |
| එදා වගේ දන නිවැරදි කළ | ලෙද |
| පපා අබිරු සිහ රජිඳකු ගේ | වෙස |
| පෙන්වා අපහට නිවැරදි බුදු | බණ |
| වඩින්න සමිඳුනි යළි පින් බිම | වෙත |



# බුහුටි අනුගාමිකයෙක්

"සිංහලයිනි නැගිටිව්! බුද්ධගයාව බේරා ගනිව්!" යන ආදී කාහල නාද නගමින් දීප චාරිකාවේ යෙදී සිටි එක් සමයෙක දේශනාවක් සඳහා ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා ඉඳුරුවේ පිරිමි පාසලට ගියේ ය. රැස්ව සිටි සහශ්‍ර සංඛ්‍යාත නරනාරී ගණයාහට දේශනය පවත්වන්නට සැරසෙනවාත් සමඟම වේදිකාව ඉදිරියට පැමිණියේ සොළොස් හැවිරිදි පමණ වයසැති ශිෂ්‍ය මානවකයෙකි. ඔහු කැන්නන්තූර් රෙද්දකුත් සුදු බැනියමකුත් ඇඳ සිටියේ ය. කොණ්ඩය බැඳ සිටියේ ය. නළල පුළුල් ය. නෙත් දීප්තිමත් ය. පැහැය රන්වන් ය.

"මේ මොකද මේ?" යි ළමයා දෙස බැලූ අනගාරිකයෝ විමසූහ.

"කවි පෙළක් කියවන්න" මුල් ගුරු තෙමේ වහා හුනස්නෙන් නැගිට පිළිතුරු දුන්නේ ය.

"හා හා! ඔය කවි සින්දු සිලෝ ඕනැ නෑ-"

"තමුන්නාන්සේට ආශිර්වාද කරලා ඒ ළමයම හැදුව කවි පෙළක්" යයි මුල් ගුරු තෙමේ යළිත් කීවේ ය.

"හූම්!"

උච්ච උච්චාරණයෙන් හා ස්වර සංවරයෙන් යුක්තව ළමයා කවි පෙළ කීවේ ය. කියද්දීත් - අවසානයේ දීත් අනගාරිකයන් ගේ උවනත පහළව පැවතුනේ ප්‍රසාදයකි. ආනන්දයකි.

"හූම්! බොහොම හොඳයි. බොහොම මිහිරියි" ධර්මපාලතුමා පවසා, "වයස කීයද? යි ළමයාගෙන් විමසුවේය.

"අවුරුදු දහ හතරයි"

"නම?"

"පේදිරික් සිල්වා"

"ඔන්න වල්අලියා! කවුද ඔය නම දැම්ම ගොන්තඩියා" යයි අනගාරිකයෝ කෝපයෙන් ප්‍රශ්න කොට 'උඹේ - උඹේ නම අද හිටන් පේදිරික් සිල්වා නෙවෙයි. පියදාස සිරිසේන" යයි නිගමනය කළේ ය.

මෙය වූ කලී ගතවණු අර්ධ ශතවර්ෂය මුළුල්ලේම ස්වකීය අනනුකරණීය ප්‍රවෘත්ති පත්‍ර කලායිනුදු ග්‍රන්ථයන් ගෙනුදු වේදිකාවන් ගෙනුදු අස්වාභාවික වාග් චාතුර්ය යනුදු ලංකාවටත් සිංහල ජාතියටත් සම්බුද්ධ ශාසනයටත් සිංහල සාහිත්‍යයටත් අනුපමේය අසදෘශ සේවයක් සිදු කළ පියදාස සිරිසේන මහතා පළමු කොටම එනමින් බෞතීස්ම වූ අවස්ථාවය.

**කේ. බී සුගතදාස සූරීන් ගේ අනගාරික ධර්මපාල අපදානය කෘතියෙනි. (1986)**



# විචිත්‍ර ධර්ම කථිකයන් වහන්සේ නමකගේ අපවත්වීම

අල්පේච්ඡ, සංඝ ශෝභන ගුණවලින් පිරිපුන්, මහජනතාව අතර අතිශයින් ප්‍රසාදයට පත් වූ විචිත්‍ර ධර්ම කථිකයාණන් වහන්සේ නමක් වූ කම්මට්ඨානාචාර්ය, අතිගරු දොඩම්ගොඩ අස්සජී නායක ස්වාමින්ද්‍රයන් වහන්සේ ගේ අපවත් වීම පිළිබඳව "බෞද්ධ ළමයා" ගේ සාතිශය සංවේගය මෙයින් පළකර සිටිමු. මොරටුව, රාවතාවත්තේ "ශ්‍රී කවිධජ" භාවනා මූලස්ථානාධිපති, අමරපුර නිකායේ අධිකරණ සංඝනායක පදවිය හෙබැවූ, සදහම් වැස්සෙන් ලොකු කුඩා හැම දෙනාගේ සිත් සතන්හි සැදැහැ මල් පල සරු කළ, අතිගරු දොඩම්ගොඩ අස්සජී නාහිමිපාණන් ගේ උතුම් සසුන් මෙහෙවරට උපහාර පිණිස, කිවිපති පාතකඩ කුලතිලක සූරීන් ලියූ පැදි කිහිපයක් මෙහිලා පළ කරමු.

**සකසු**

බින්ද ගිහි බැම් සුසංහිත වූ සීල සඟගුණ පූජනීයයි
සංඝ ශෝභන අපිස් පිළිවෙත් තපෝගුණ සම්මානනීයයි
මන්ද භාසෙන් සරල සුගමව දෙසන බණ මන නන්දනීයයි
පින් කෙතක් වන් අස්සජී නා සමිඳු පායුග වන්දනීයයි

දැනට අඩසියවසක චීවර සුවඳ විහිදා දවස තිස්සේ
බණට - දානෙට - පිරිතකට හිමි වැඩම කොට අව්වෙහිද වැස්සේ
තැනට ගැළපෙන බණ පදේකින් තථාගත බුදු දහම ඔස්සේ
පිනට දහමට මිනිස් සිත යොමු කරන්නයි බොදු මඟට බැස්සේ

කොතැන වැඩියත් චිතන සෙනඟකි සාදු නද දෙන මුනිවතින් සිට
හිතන සේ මා බණක් නැති එක දිනක් නැතිවැ'ති උන්වහන් සෙට
කථනයෙන් මන බඳින ඉරියව් සදා අපි සලකමු උතුම් කොට
පතන බුදු බව මහිම්පාණන් දිනේ ලොව්තුරු දහම් රස පිට

---

"ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා යයි ළදරුවන්ගේ පටන් මහල්ලා තෙක් ම ස්වදේශීය විදේශ හැම ජාතියක හා හැම රටක ජනයාගේ මුව'ග ලෙළදුන් අනෝමය නාමයක් ඇතිව විසූ මේ මහා පුරුෂයාගේ අභාවයෙන් සිදුවූයේ එක සිංහලයකු නැති වීමේ පාඩුව නොවේ. මිථ්‍යා දෘෂ්ටික සැඩි දෙමළ බල බිඳහැර දියකෙහෙලි නැංවූ මහා ගාමිණී කෙනෙක් අද අපට නැති විය. විදේශයන්හිද ශ්‍රී සද්ධර්ම ධ්වජය නංවා, පරවාදි සතුරන් දිනෙන් දින ජයගත් මහා පරාක්‍රමබාහු කෙනෙක් අද අපට නැති විය. තමන් සතු සියලු ධනය සම්බුද්ධ ශාසනයේ දියුණුව පිණිස නිර්ලෝභීව යෙදූ අනේපිඩු මහ සිටු කෙනෙක් අද අපට නැති විය. බුද්ධාගමයෙහි මාතෘ භූමිය වූ දඹදිව යළිත් ශාසනය පිහිටුවා දේශ දේශාන්තරයන්හි ධර්ම දූතයන් යැවූ ධර්මාශෝක නරපතියෙක් ද අද අපට නැති විය. එහෙයින් අද අපි අනාථයම්හ අසරණයම්හ!"

**හේමපාල මුනිදස සූරීහු- සිංහල බෞද්ධයා කතුවැකියෙනි. (1933 අප්‍රේල්)**



# සිරිමත් සිරි දම්පල් උතුමාණෝ ...!

ශාස්ත්‍රවේදී පූජ්‍ය කුරුණෑගල
චරණධම්ම ස්වාමීන් වහන්සේ විසිනි.

ශ්‍රේෂ්ඨ වීරවරු ජාතියකට නිතර පහළ නො වෙති, සුලභ නො වෙති. සිංහල ජාතියකට පහළ වූ එවන් දුර්ලභ ගණයේ සැබෑ වීරවරයෙකි අනගාරික ධර්මපාල සිරිමතාණෝ. විදේශ ආධිපත්‍යයට දිගු කලක් යටත්ව පැවතීමෙන් පිරිහී තිබූ සිංහලයන්ගේ ජාතික, ආගමික, සමාජීය හා සංස්කෘතික උරුමයන් පණ ගැන්වීමටත් ශිෂට සම්පන්න ජාතියක් ලෙස උරුම වී තිබූ සදාචාරවත් පරෝපකාරී ජීවන ක්‍රමය යළි නගා සිටුවීමටත් ඒ පිළිබඳ අභිමානය ඇති කිරීමටත් අප්‍රතිහත ධෛර්යයෙන් ක්‍රියා කළ මහා යුග පුරුෂයෙකු ලෙස එතුමා හැඳින්වීමේ වරදක් නැත.

1864 සැප්තැම්බර් 17 වන දින අගනුවර ප්‍රසිද්ධ ව්‍යාපාරිකයකු වූ දොන් කරෝලිස් හේවාවිතාරණ මුදලිතුමාට දිව සැදෑහැවත් උපාසිකාවක වූ මල්ලිකා හේවාවිතාරණ ළමාතැනී ගේ කුසින් උපන් මෙම පිංවත් කුමරුවා දොන් ඩේවිඩ් හේවාවිතාරණ නම් විය. සිය ළමා අවධියේදී ක්‍රිස්තියානි පාසල්වල අධ්‍යාපනය ලබා ගැනීමට සිදු වූවත් දෙමාපියන් ගේ මනා මඟපෙන්වීම අනුව ලැබූ බෞද්ධාගමික හුරුව නිසාත් පොහොය අටසිල් සමාදන් වීමෙන් ලැබූ පුහුණුව නිසාත් නියම හෙළ බොදු දරුවෙකු වීමට එතුමා භාග්‍යසම්පන්න විය.

කොටහේන දීපදුත්තාරාම විහාරය සමග තිබූ සමීප සබඳතාවත්, හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා සමඟ සබඳතාවත්, සිය පරපුරේ ධන ශ්‍රම පරිත්‍යාගයෙන් තැනුණු මහ විදු පියසක් වූ කොළඹ මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනින් බිහිවූ ශ්‍රේෂ්ඨ පඬි මිණි පහන් වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමියන් සහ හෙයියන්තුඩුවේ දේවමිත්ත හිමියන්ගෙන් ලද පාලි සිංහල භාෂා ඥනයත් හේවාවිතාරණ තරුණයාගේ ජීවිතය වෙනස් කිරීමට හේතුවන්ට ඇත. පරමවිඥනාර්ථ සමාගමේ සඟරා පරිශීලනයෙන් තව තවත් සිය දනුම් පිපාසය සංසිඳවා ගැනීමටත් ,නවීන දැනුමින් සන්නද්ධ වන්නටත් උපකාරී විය. මේ සියලු කාරණාවන් ඒකරාශී වීමෙන් ලද ඥන සම්භාරය ,පරිචය, ඔද වැඩුණු දේශ වාත්සල්‍ය, ආගමාලය හේතුවෙන් 1886 වන විට හේවාවිතාරණ තරුණයා බටහිර නම අතහැර 'ධර්මපාල' නම් වූ ආර්ය සිංහල නාමය ලබාගත් අතර අනගාරික බවට ද පත් වීය. එතැන් පටන් එම ජීවිතය කැපවූයේ සිංහල ජාතියත් බෞද්ධාගමත් රැකගැනීම වෙනුවෙනි.

1981 මහා බෝධි සමාගම පිහිටුවා සමස්ත බෞද්ධ ජනතාවටම අහිමිව තිබූ අන්තවාදී හින්දු ග්‍රහණයට ලක්ව තිබූ බුද්ධගයා පුදබිම බේරා ගැනීමේ මහා මෙහෙයුම අරඹන ලදී. මේ අතර ජාත්‍යන්තර වශයෙන් දේශන කීපයක් පැවැත්වීමටත් සමුළුවලට සහභාගී වීමට තරම් ධෛර්ය සම්පන්න එඩිතර වූ ධර්මපාල තුමාගේ ඍජු චතුර වාග් විලාසය කාගේත් සිත් ඇද ගන්නා සුලු ස්වරූපයක් ගෙන තිබුණි. මෙම ඍජු චතුර වාග් ප්‍රහාරයන් තුළින් තම ජාතියේ තිබූ පරගැති චාර්යාවන්, සිරිත් විරිත් පමණක් නොව බටහිර නම් ගම්, ඇඳුම් පැළඳුම් පවා නැවත හෙළ සංස්කෘතික අනන්‍යතාවට හැඩගැසීමට එතුමා සමත් විය.

1906 දී සිංහල බෞද්ධයා පුවත් පත අරඹා දනගත යුතු කරුණු නමින් සතිපතා පල කළ ලිපි පෙළ තුළින් එතුමන් තුළ තිබූ ආර්ථික, දේශපාලන ආදී ක්ෂෙත්‍රයන් පිළිබඳව තිබූ පළල්

ඥනයත් සිංහල සංස්කෘතිය සහ ආගම නගා සිටුවීමේ බරපතල අපේක්ෂාවත් දේශපාලන, ආර්ථික ස්වාධීනතාව ලබා ගැනීමේ අවශ්‍යතාවත් මනාව ප්‍රකට කර තිබේ. ලංකාව පුරාම දෙසුම් පවත්වමින් සිය ජාතිය නගා සිටුවීමට පුදුම සහගත කැපකිරීමක් කොට සිය දිවියේ පශ්චිම කාලයේ දී 1931 දී සිරි දේවමිත්ත ධම්මපාල නමින් උතුම් පැවිදි දිවියට පත් වූ එතුමා 1933 දී අධිශීල සංඛ්‍යාත උපසම්පදවට පත් වීය. පරහිතකාමී ගුණ වලින් යුතු බෝසත් දිවියක් ගෙවූ සිරි දේවමිත්ත ධම්මපාල හිමියෝ 1933 අප්‍රේල් මස 29 වන දින බරණැස මූලගන්ධ කුටි විහාරයේදී මෙලොවින් නික්ම ගියහ.

මෙවන් ශ්‍රේෂ්ඨ වීරවරයන් බිහිවූ රටක, ජාතියක, ආගමක,; උපන් දරුවන් ලෙස ඔබ සතු වගකීම හා යුතුකම වන්නේ එම වීර චරිත වලින් තම දිවිය පොහොසත් කර ගැනීමයි. විශේෂයෙන් මේ ගෙවී යන අනගාරික ධර්මපාල තුමන්ගේ 150 වන උපත් සැමරුම වසරේදී, එම දිනය යෙදෙන සැප්තැම්බර් 17 වන දින ද සිහිපත් කොට ධර්මපාල තුමන්, ගිහි දරුවන්ට දුන් අගනා උපදේශ වූ ගිහි දින චර්යාව වැනි දෑ අනුගමනය කිරීමට පෙළ ගැසීමයි. උදෑසන අවදි වීමේ පටන් ආහාර අනුභවය වස්ත්‍ර ඇඳීම ආදී සියල්ල පිළිවෙලින් සිදුකරන ආකාරය ඇතුළත් මෙම චර්යා පද්ධතිය පොතපත පරිශීලනයෙන් උගත හැකිවේ.

වත්මන් දරුපරපුරට ධර්මපාල උතුමාණන්ට උපහාර දැක්වියහැකි වන්නේද එතුමා පැවසූ පරිදි රට ජාතිය ආගම භාෂාව යන රත්න සතර රැකගැනීම තමාගේ පරම යුතුකම කොට සලකා ධර්මපාල චින්තනයෙන් තම දිවිය පොහොසත් කරගැනීමෙනි.